# මහින්ද චින්තනය යටතේ සම්පාදිත පාරිසරික නීති ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපායට බලපාන ආකාරයඃ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන්

**ආර්. සී. පල්ලියගුරුගේ සහ එච්. එම්. කේ. සංජලී**
**සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**
***palliyaguruge6@gmail.com***

විසි එක් වෙනි සියවසේ දී පරිසරය පිළිබඳ ව වැඩි නැඹුරුතාවක් දක්වා තිබේ. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුව ද පරිසර සංරක්ෂණය කෙරෙහි වැඩි නැඹුරුතාවක් දක්වා තිබේ. ඒ අනුව මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "හිල්ල පිරුණු රටක්" හා "පරිසර සංරක්ෂණයට තිරසාර පිළිවෙතක්" යන සංකල්පවලට අනුකූලව විවිධ ව්‍යාපෘති දිරි ගන්වමින් පරිසරය ආරක්ෂාව වෙනුවෙන් නව නීති සම්පාදනය කර තිබෙනු දක්නට ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ 2009 අංක 65 දරන කැළෑ (සංශෝධන) පනත හා 2000 අංක 53 දරණ ජාතික පාරිසරික (සංශෝධන) පනත මඟින් පාරිසරික ආරක්ෂාව සඳහා විධි විධාන සලසා දී තිබීම පෙන්වා දිය හැකි ය.

මහින්ද චින්තනය යටතේ ශ්‍රී ලංකාවේ සම්පාදිත නව පාරිසරික නීති ජනතාවගේ ජීවනෝපායට බලපාන්නේ කෙසේද යන්න අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පරිසර පනත් මඟින් ජනතාවගේ ජීවනෝපායට වන බලපෑම විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. සෙසු අරමුණු අතර පාරිසරික සංරක්ෂණය සඳහා සම්පාදිත නීති ක්‍රියාත්මක වනවාද යන්න සොයාබැලීම හා ඒ තුළින් සාමාන්‍ය ජන සමාජයේ වෙනසක් සිදුවී තිබේ ද යන්න අධ්‍යයනයට ලක්කර තිබේ.

මෙම අධ්‍යයනය ප්‍රමාණාත්මක අධ්‍යයනයකි. අධ්‍යයනයේ ප්‍රාථමික දත්ත ව්‍යුහගත ප්‍රශ්නාවලී ක්‍රමය සහ අවිධිමත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මූලික කරගෙන රැස් කර තිබේ. එමෙන් ම ගුණාත්මක දත්ත ද භාවිත කර ඇත. අධ්‍යයන ප්‍රදේශය වූයේ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යි. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරිසරය හා බැඳුණු ජීවනෝපාය කරන විශාල පිරිසක් සිටින බව එම ප්‍රදේශයේ කරන ලද අවිධිමත් ගවේෂණයක් මඟින් හෙළි කර ගන්නා ලදි. එය ග්‍රාම නිලධාරි වසම් 39 කින් සමන්විතය. එබැවින් හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය බදුල්ල කොළඹ ප්‍රධාන පාර පදනම් කර ගෙන ඉහළ ග්‍රාම නිලධාරී වසම් සහ පහළ ග්‍රාම නිලධාරී වසම් වශයෙන් කොටස් දෙකකට හඳුනා ගැනේ. එකී ග්‍රාම නිලධාරී වසම් අතුරින් ඉහළ ග්‍රාම නිලධාරී වසම් 02 ක් සහ පහළ ග්‍රාම නිලධාරී වසම් 02 සරල සසම්භාවී ලෙස තෝරා ගනු ලැබීය. ඒ අනුව ග්‍රාම නිලධාරී වසම් ලෙස ගම්පහ කොළොන්ගස්තැන්න, සොරගුණේ හා කිරවනාගම තෝරා ගනු ලැබීය. මෙම ග්‍රාම නිලධාරී වසම්වල පරිසරය හා බැඳුණු ජීවනෝපායන් සිදු කරන වයස අවුරුදු 18 ට වැඩි පුද්ගලයන් 100 දෙනෙකුගෙන් සමන්විත නියැදියකට ව්‍යුහගත ප්‍රශ්නාවලිය ඉදිරිපත් කොට දත්ත ලබා ගනු ලැබීය. දත්ත විශ්ලේෂණය සාමාජීය විද්‍යාවන් සඳහා වූ සංඛ්‍යානමය

මෘදුකාංග හෙවත් *Statistical Package for Social Science (SPSS)* සහ *Excel* යන පරිගණක මෘදුකාංගය යොදාගෙන සිදු කරන ලදි.

මෙම ප්‍රදේශයේ ජනතාව පරිසරය සම්බන්ධ ජීවනෝපායන් වසර 5 කට වැඩි කාල සීමාවක් සිදු කර තිබෙන අතර ග්‍රාම නිළධාරී වසම් හතර තුළ වසර 2 ක කාල සීමාවක් පවුල් 8 ක් ද, වසර 3 ක කාල සීමාවක් පවුල් 19 ක් ද, වසර 4 ක කාල සීමාවක් පවුල් 21 ක් ද, වසර 5 ක කාල සීමාවක් පවුල් 17 ක් හා වසර 5 කට වඩා වැඩියෙන් පවුල් 35 කට වඩා වැඩි පිරිසක් ද මෙම ජීවනෝපායන් සිදුකර තිබේ. පරම්පරාගතව වර්ෂ ගණනාවක් ම පරිසරය හා බැඳුණු ජීවනෝපායන් කරගෙන යන පවුල් මෙම ප්‍රදේශයේ පදිංචි වී සිටිති.

මෙම ප්‍රදේශයේ ජනතාව පරිසරය සම්බන්ධ රැකියාවන්හි නිරතවීමට බලපෑ ප්‍රධානතම සාධකය වූයේ වෙනත් රැකියාවක් නොමැති කමයි. එය 43% පමණ විය. ඒ වගේම මෙවැනි රැකියාවන් තම ප්‍රදේශයේ ම කළ හැකි වීම යන සාධකයත් මේ සඳහා සුවිශේෂී හේතුවක් විය. තම ප්‍රදේශයේ ම කළ හැකි වීම නිසා මෙම රැකියාව තෝරා ගැනීමේ ප්‍රතිශතය 31% විය.
විශේෂයෙන්ම ජනතාව ජීවනෝපායන් කරගෙන යාමේ දී දඬුවම් ලබාදීම තුළින් එදිනෙදා ආදායම් මාර්ග අහිමි වීම මත පවුලේ ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වී තිබෙන බව හඳුනාගත හැකි විය. ජීවනෝපායන් කරගෙන යාමේ දී දඬුවම් ලබාදීම තුළින් 39% කගේ ජීවනෝපායන් පහත වැටී තිබෙන බව ද 35% ක ප්‍රමාණයක් අදහස් දැක්වීමට අකමැත්තක් දක්වන බවද මෙයින් නිරූපණය විය.

මෙම පාරිසරික නීති තුළින් වඩා ඵලදායි ප්‍රතිපල ග්‍රාමීය ජනතාවට ලබා දිය හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පළමුව යෝජනා කළ හැකි ය. පරිසර නීති ජනතාවගේ ජීවනෝපායන් සඳහා අසීමිත ලෙස බලපෑම් නොකළ යුතු ය. ඒවා සාධාරණව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු නිලධාරීන් පිරිසක් සිටීම. කැලෑ ගිනි තැබීමෙන් පරිසරය ට සිදුවන හානි පිළිබඳව දැනුවත් කිරීම කළ යුතු ය. වගා කිරීමට සුදුසු ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීමේදී සිදුවන අක්‍රමිකතා වළක්වා ගැනීමට නම් එම ක්‍රියාවලිය ක්‍රමවත්ව සැලසුම් කළ යුතු ය. පරිසරය විනාශ කිරීමෙන් මතුවන ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම තුළින් ජනතාවට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි අතර ඒ තුළින් පරිසර විනාශය අවම කරගත හැකි ය.
පරිසරය ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

***ප්‍රමුඛ පදඃ*** *පාරිසරික නීති, මහින්ද චින්තනය, ග්‍රාමීය, ජීවනෝපාය, දරිද්‍රතාව*